**බදුල්ල මහා නගර සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
-----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 05 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 07 දින ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට බදුල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විනෝද බදු ගිණුමේ රු.1,614,454 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) වටිනාකම රු.28,960 ක් වූ අගරු චෙක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් නොකිරීමෙන් එම වටිනාකමින් ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාවිතයේ නොමැති රු.905,000 ක් වටිනා යන්ත්‍ර උපකරණ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම් මූල්‍ය ප්‍රකාශනවල රු.1,643,440 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම් මූල්‍ය ප්‍රකාශනවල රු.481,476 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ මුද්දර ගාස්තු රු.27,614,175 ක් වර්ෂයේ ආදායමක් ලෙස දක්වා තිබුණි.

(උ) අවසාන තොග වටිනාකම රු.178,812 ක් අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂයන් අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳීමේදී රු. 132,370,338 කින් නොසැසඳුණි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල රු. 57,099,708 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.148,339,577 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු.68,987,350 ක් වූ වත්කම් ගිණුම් 04 ක් ලෙජරයේ දැක්වෙන පරිදි අතිරික්තතා හා ඌනතා ගිණුමේ හර වටිනාකම රු.3,365,019 ක් සහ බැර වටිනාකම රු.12,313,461 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය / සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

------------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

**නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

---------------------------------------------------

| නීතිරීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) (i) මහා නගර සභා ආඥා පනතේ 127(1) වන වගන්තිය සහ 42 වගන්තිය | අනුමත කරන ලද ගොඩනැගිලි අයදුම්පත් 1075 කට අදාලව අනුකූලතා සහතික 141 ක් පමණක් නිකුත් කර තිබුණි. |
| (ii) 218 වගන්තිය | නගරාධිපතිවරයා විසින් එක් එක් මුදල් වර්ෂය අවසානයේ ඔහුගේ පරිපාලනය පිළිබඳ සවිස්තර වාර්තාවක් වර්ෂය තුළ සභාව වෙත ඉදිරිපත් කර සති 06 ක් තුළ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2012, 2013, 2014 සහ 2015 යන වර්ෂ වල මෙම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) 222 වගන්තිය | මුදල් වර්ෂය අවසන්වීමෙන් පසුව විගණකාධිපති වරයාගේ වාර්තාව සභාව වෙතද අනු පිටපතක් අමාත්‍යවරයා වෙතද ඉදිරිපත් කලයුතු වුවත් 2012, 2014, 2015 වර්ෂ සඳහා එසේ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) 226 (6) වගන්තිය | 1999 සිට නිකුත් කල රු.3,835,000 ක වටිනාකමකින් යුත් අධිභාර මේ දක්වා අයකර ගෙන නොතිබුණි. |
| (v) 252 අධිකාරියේ 273 28 ඡේදය | රථවාහන හා යන්ත්‍රෝපකරණ 07 ක් අතුරු ව්‍යවස්ථා වගන්තිය පිළියෙල කිරීමකින් තොරව කුලියට දී තිබුණි. |
| (vi) 254 (අ) වගන්තිය | 2016 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 25,588,294 ක හිඟ ආදායමක් අයකර ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23"අ" | (i) පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන හඳුනාගැනීම සඳහා වාර්ෂිකව සමීක්ෂණයක් කර නොතිබුණි.<br>(ii) ඝෝෂාතකාගාරය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ xvi වන පරිච්ඡේදයේ 133 වගන්තිය | ස්ථාවර තැන්පත් ගිණුම් සඳහා පොලී ගෙවීමේ දී බැංකුව විසින් රඳවාගෙන තිබුණු රු.80,308 ක පොලී මුදල් නැවත සභාව වෙත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | (i) මු.රෙ. 371 | රු.622,103 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. |
| | (ii) මු.රෙ. 396 (ඇ) | නිකුත් කර මාස 06 ක් ඉක්මවූ රු. 178,273 ක් වටිනා චෙක්පත් 29 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදය | |
| | 4.5 හා 4.6 වගන්ති | සේවය අතහැර ගිය හා වැඩ තහනමට ලක්වූ නිලධාරීන්ගෙන් ලැබිය යුතු රු.202,125 ක් ඇපකරුවන් ගෙන් අයකර නොතිබුණි. |
| | ( රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2009 අප්‍රේල් 16 දිනැති හා අංක 09/2009 චක්‍රලේඛය | (i) සේවයේ නියුතු නිලධාරීන් 40 ක් පමණක් ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබුණි.<br>(ii) ඇඟිලි සළකුණු යන්ත්‍රයේ සනාථ නොවන අවස්ථා 17 කදී අතිකාල හා නිවාඩු දින වැටුප් රු.42,672 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (උ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/1990 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රථවාහන 31 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.29,860,161 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,883,986 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

2016 දෙසැම්බර් 31 දිනට ඉකුත් වර්ෂයට අදාලව නගර සභා අරමුදලට ලැබිය යුතු හිඟහිටි ආදායම රු.32,089,208 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ බිල් කල ආදායමෙන් රු.21,569,697 ක් දෙසැම්බර් 31 දිනය වන විටත් හිඟ හිටිව තිබුණි.

2.2.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.7,237,019 ක් හා මුද්දර ගාස්තු රු.10,381,452 ක් අයවිය යුතුව තිබුණි.

2.2.3 **විනෝද බදු**

2016 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු විනෝද බදු රු. 1,614,454 ක් හිඟව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) සභාව සතු බැකෝ යන්ත්‍රය 2016 වර්ෂයේ ධාවනය කළ යන්ත්‍ර පැය 297 ක් සම්බන්ධයෙන් ධාවන සටහන් පවත්වා නොමැති අතර, මේ සඳහා රු.211,612 ක් වටිනා ඉන්ධන ලීටර් 2227.5 ක් යොදවා තිබුණි.

(ආ) 2016 වර්ෂයේ බැකෝ යන්ත්‍රය භාවිතා කිරීමේ දී යන්ත්‍ර පැයක් සඳහා ඉන්ධන වශයෙන් සාමාන්‍ය පරිභෝජනයට වඩා රු.142.50 ක් වැඩියෙන් වැයකිරීම හේතුවෙන් යන්ත්‍ර පැය 1261 ක් වෙනුවෙන් රු.179,692 ක් වැඩියෙන් වැයකොට තිබුණි.

(ඇ) 2008 ජුනි 26 දිනැති රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛය අනුව නාගරික කොමසාරිස්වරයාගේ වැටුපට නිල වාහන දීමනා ඇතුලත්ව තිබියදී සභාවේ කැබ් රථය භාවිතා කිරීම සඳහා 2015 හා 2016 වර්ෂවලදී රු.191,805 ක් වටිනා ඉන්ධන මහා නගර සභාවෙන් නිකුත් කර තිබුණි.

3.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

මහා නගර සභාව සෘජු ශ්‍රම පදනම මත සිදුකරනු ලබන කර්මාන්ත සඳහා භාණ්ඩ මිලදී ගැනීමේ දී ප්‍රමාණය ඉක්මවා භාණ්ඩ ඇණවුම් කර තිබීම හේතුවෙන් රු.1,682,153 ක් වටිනා භාණ්ඩ ගබඩාව තුළ ඉතිරිව තිබුණි.

3.3 **හඳුනාගත් පාඩු**

රු.1,915,910 ක් වූ අගරු චෙක්පත් වටිනාකම 2002 සිට මේ දක්වා අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 **නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්**

රු.352,972 ක් වටිනා ලීටර් 20 ප්ලාස්ටික් බඳුන් 1297 ක් වර්ෂ 03 කට ආසන්න කාලයක් ප්‍රයෝජනයක් නොගෙන සභා භූමිය තුළ රඳවා ගෙන තිබුණි.

3.5 **සන අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

(අ) කසළ කළමනාකරණය සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා නගර මධ්‍යයේ පවතින යෝජිත ක්‍රීඩා පිටි භූමිය භාවිතා කිරීම හේතුවෙන් අවට පවතින ක්‍රීඩා භූමි හා පිහිණුම් තටාකය මහින් භාවිතා කිරීම දුෂ්කර වී ඇති අතර නගරය අවට දුර්ගන්ධය හැමීම් නිරීක්ෂණය විය.

(ii) වර්ෂා කාලවලදී කසල රැස්කිරීමට භාවිතා කරනු ලබන ස්ථානයෙහි රැස්වන ජලය හා කසල බදුලු ඔයට ගලායාමට සැලැස්වා තිබුණි.

(iii) 2016 වර්ෂයේ කසල ගොඩ හා පොලිතීන් ගිනි ගැනීමක් සිදුවීමෙන් විශාල පරිසර හානියක් සිදුවී තිබුණි.

(iv) සන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ මහා නගර සභාවේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව සන අපද්‍රව්‍ය රැස්කර නොතිබුණි.

(ආ) බදුල්ල මහා නගර සභා සීමාව තුළ මල අපද්‍රව්‍ය බැහැර කිරීමේ විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කොට නොතිබුණි.

(ඇ) සෝගාතකාගාර පරිශ්‍රය අපිරිසිදු තත්ත්වයේ පැවති බව නිරීක්ෂණය විය.

(ඈ) දෛනිකව සෝගාතකාගාරයෙන් අපද්‍රව්‍ය නිරන්තරයෙන් පිටාරයාමෙන් බදුලු ඔයෙහි ජලයට එකතුවන බව නිරීක්ෂණය විය.

3.6 **සේවක ණය**

-----------------

රු.304,780 ක් වටිනා ණය ලිපිගොනු අස්ථානගත වී තිබුණු අතර, එම ණය මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

----------------------------------------

4.1 **අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂයේදී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලනයේදී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------------

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

-----------------------

2016 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------------

ප්‍රවර්තන වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

5. **පද්ධති හා පාලනය**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම්
(ආ) ගිණුම්කරණය
(ඇ) ගබඩා පාලනය
(ඈ) වාහන පාලනය
(ඉ) ණයගැතියෝ සහ ණයහිමියෝ